# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1980 අංක 28 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 සැප්තැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිළ : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 28 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 අගෝස්තු මස 7 වන දින]

එල්. ඩී.—ඕ. 59/79.

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

මෙතෙක් මහනුවර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ආගමික බල ප්‍රදේශය යටතේ පැවැති ප්‍රදේශයෙන් කොටසක් බදුලු දියෝකිසිය නමින් නව දියෝකිසියක් බවට පත් කොට අතිගරු ආචාර්ය දොන් ලියෝ නානායක්කාර, ඕ. එස්. බී., පූජක තුමාණන් එය පාලනය කිරීම සඳහා බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වශයෙන් යථා පරිදි පත් කරනු ලැබ ඇති හෙයින් ද : **පූර්විකාව.**

බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීමට විධි විධාන සලස්වනු පිණිස සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම අවස්ථානුකූල හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 28 දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ප්‍රකෘෂ්ඨ නාමය.**

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනතේ 3 වන වගන්තියට ඉක්බිතිව ම, එහි 3අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු, පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **3අ වන අලුත් වගන්තිය 338 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.**

"බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීම.

3අ. බදුල්ලේ රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ, එනම්, අතිගරු ආචාර්ය දොන් ලියෝ නානායක්කාර, ඕ. එස්. බී., පූජකතුමාණන් සහ රෝමානු කතෝලික සභාවේ නීති සහ ව්‍යවහාර යන් අනුව යථා පරිදි පත් කරනු ලබන එතුමාණන්ගේ අනුප්‍රාප්තිකයන් ද සංස්ථාවක් වන අතර ඒ සංස්ථාව මේ ආඥාපනතේ සියලු කාර්යයන් සඳහා බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ යන නාමයෙන් හැඳින්වෙන්නේ ය. තවද එම නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් එයට ඇත්තේ ය. සෑම වර්ගයකම චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීමේ, මිලට ගැනීමේ, ලබා

ගැනීමේ, දරා සිටීමේ හා භුක්ති විඳීමේත් එම දේපළ විකිණීමේ හෝ ඒ පිළිබඳව අන් ආකාරයකින් සුදුස්සක් කිරීමේත් පූර්ණ බලය ඒ සංස්ථාවට ඇති අතර ඒ දේපළ සම්බන්ධයෙන් එම නාමයෙන් සංස්ථාව විසින් සියලු අධිකරණයන්හි නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි වන්නේ ය.".

5අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

3. 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය :—

" බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත දේපළ සතුකිරීම.

5අ. ස්වකීය නිල තත්ත්වයෙන් එකී අතිගරු ආචාර්ය දොන් ලියෝ නානායක්කාර, ඕ. එස්. බී., පූජකතුමාණන් විසින් දනට අත්කරගෙන ඇති, දරනු ලබන හෝ සන්තකයෙහි තබාගෙන සිටින චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම සියලු දේපළ ඒවා කෙරෙහි බලපාන යම් භාරයකට හෝ කොන්දේසියකට හෝ යටත් ව, එකී බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත සතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) නැවත අංක කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) බදුල්ලේ දියෝකීසිය ඇති කිරීම හේතුකොටගෙන බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ පාලනයට යටත් වන චංචල හෝ නිශ්චල සියලු දේපළ සම්බන්ධයෙන් බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ නමට මහනුවර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් ලියා අත්සන් කරනු ලබන ශිම් කර දීමේ, විකිණීමේ හෝ පැවරීමේ කවර සාධන පත්‍රයක් වුව ද මුද්දර ආඥාපනතේ "අ" උපලේඛනයේ I වන කොටසෙහි 23 (7) වන කරුණ යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබීමට යටත් සාධන පත්‍රයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".